ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## ඉන්දීය ප්‍රදානයක් යටතේ ශ්‍රී ලංකාවේ උතුරු දුම්රිය මාර්ගය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කටයුතු ඇරඹේ

ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සහ ප්‍රවාහන, මහා මාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය බිමල් රත්නායක මහතා විසින් ඇමරිකානු ඩොලර් මිලියන 5ක ඉන්දීය ප්‍රදානයක් යටතේ ශ්‍රී ලංකාවේ උතුරු දුම්රිය මාර්ගය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කටයුතු සමාරම්භ කරන ලදී. කෘෂිකර්මාන්ත සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍ය නාමල් කරුණාරත්න මහතා, වයඹ පළාත් ආණ්ඩුකාර තිස්ස කුමාරිසිරි වර්ණසූරිය මහතා සහ පාර්ලිමේන්තු මන්ත්‍රිනි ගීතා හේරත් මහත්මිය ද මෙම අවස්ථාවට සහභාගී වූහ. මෙම ව්‍යාපෘතිය විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර නිවේදනය කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 450ක නැවත ඉදි කිරීමේ සහ පුනරුත්ථාපන පැකේජයේ කොටසකි.

2. දිට්වා සුළි කුණාටුවෙන් විශේෂයෙන්ම, මගී ප්‍රවාහනය, අත්‍යවශ්‍ය සේවා සහ ලොජිස්ටික් කටයුතු සඳහා අතිශයින් වැදගත් වන දුම්රිය මාර්ග ඇතුළු අත්‍යවශ්‍ය සම්බන්ධතා යටිතල පහසුකම්වලට දැඩි හානි සිදු වූ අතර එබැවින් ඒවා කඩිනමින් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අවශ්‍යතාවය පැන නැගිණ. මේ අනුව, ඉන්දීය රජය පෙර දී ඉන්දීය ආධාර යටතේ ඉදි කරන ලද උතුරු දුම්රිය මාර්ගය යළි ඉදි කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා ප්‍රදානයක් යටතේ සහයෝගය ලබා දෙන බව නිවේදනය කළේය.

3. දුම්රිය මාර්ග ඉදි කිරීම සහ පුනරුත්ථාපනය සම්බන්ධයෙන් විශාල අත්දැකීම් සම්භාරයක් සහිත ඉන්දීය රාජ්‍ය අංශයේ සමාගමක් වන IRCON ඉන්ටර්නැෂනල් ලිමිටඩ් විසින් දුම්රිය මාර්ගය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. දිට්වා සුළි කුණාටුවෙන් උතුරු සහ උතුරු මැද පළාත්වල දුම්රිය සම්බන්ධතාවන්ට දැඩි බාධා පමුණුවමින් හානි වූ උතුරු දුම්රිය මාර්ගයේ මහව - ඕමන්තේ, ඕමන්තේ - යාපනය සහ මැදවච්චිය - මන්නාරම යන දුම්රිය මාර්ගයන් මේ යටතේ ආවරණය කරනු ඇත.

4. ඉන්දීය ආධාර පැකේජය නිවේදනය කර සති තුනක් ඉක්මවා යාමටත් පෙර ඊයේ දිනයේදී, දුම්රිය මාර්ගය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කටයුතු ආරම්භ කිරීම තුළින් සංවර්ධන සහයෝගීතා ව්‍යාපෘතීන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට ඉන්දියාව විසින් ලබා

දෙන ප්‍රමුඛත්වය පිළිබිඹු වේ. මාස තුනක් ඇතුළත එනම්, සිංහල සහ දෙමළ අලුත් අවුරුද්දට පෙරාතුව 2026 අප්‍රේල් වන විට දිට්වා සුළි කුණාටුවට පෙර තිබූ පරිදි දුම්රිය සේවා කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ. ඉතිරි වැඩ කටයුතු 2026 මැයි වන විට සම්පූර්ණ කිරීමට ඉලක්ක කර ඇත. වේගවත් ලෙස වැඩ කටයුතු සිදු කිරීම සඳහා මිනිස් ශ්‍රමය විශාල ලෙස යෙදවීම සහ විශේෂ යන්ත්‍රෝපකරණ භාවිතා කිරීම ද සිදු කරනු ඇත. IRCON ඉන්ටර්නැෂනල් ලිමිටඩ් විසින් මහව - ඕමන්තේ දුම්රිය මාර්ගයේ ඉතිරි වැඩ කටයුතු ද ඉන්දියාව විසින් මෑතක දී දීර්ඝ කරන ලද ණය පහසුකම යටතේ සම්පූර්ණ කරනු ඇත.

5. දුම්රිය ක්ෂේත්‍රය ඉන්දියා - ශ්‍රී ලංකා සංවර්ධන සහයෝගීතාවයේ ඉතා වැදගත් ක්ෂේත්‍රයකි. සමස්තයක් වශයෙන් ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ දුම්රිය ක්ෂේත්‍රය සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 1.2ක පමණ මූල්‍යාධාර ලබා දී ඇත. කිලෝ මීටර් 500ක පමණ දුම්රිය මාර්ග ඉදි කිරීම සහ පුනරුත්ථාපනය කිරීම, කිලෝ මීටර් 400ක පමණ දුම්රිය මාර්ග සඳහා සංඥා පද්ධතීන් සැපයීම, දුම්රිය සැපයීම, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මෙහෙයුම් ධාරිතාවය සැලකිය යුතු ලෙස ශක්තිමත් කිරීම සහ බාධාවකින් තොරව දුම්රිය සේවා පවත්වාගෙන යාම සඳහා දුම්රිය ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීම යනාදිය මෙයට ඇතුළත් වේ.

*****

**කොළඹ**

***2026*** ජනවාරි ***12***